# රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு**

**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | CS/SLAS/EB/Result | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2024.07.31 |

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
කොමිෂන් සභා ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමුවන කාර්යක්මතා කඩඉම් විභාගය -2019 (II) සහ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 (I) ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2357 හා 2023.11.03 දිනැති ගැසට් පත්‍රය මගින් අයදුම්පත් කැඳවන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2019 (II) සහ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2020(I) යන විභාග සඳහා අයදුම් කළ සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල මෙම අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ පළ කර ඇත.

02. ඒ අනුව 2023.11.03 දිනැති උක්ත විභාගයන්හි අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙහි ඡේද අංක 16 මගින් දක්වා ඇති පරිදි, ඉලෙක්ට්‍රොනික ලේඛන හා ඉලෙක්ට්‍රෝනික සන්නිවේදනය පිළිබඳ වූ ජනාධිපති ලේකම්ගේ අංක SP/SB/1/13 හා 2013.10.09 දිනැති චක්‍රලේඛය අනුව, අමාත්‍යාංශ වෙබ් අඩවියේ සඳහන් ප්‍රතිඵල පළ කිරීම නිලධාරීන්ට ප්‍රතිඵල නිකුත් කිරීමක් ලෙස සැලකිය යුතු අතර, දෙපාර්තමේන්තු ප්‍රධානීන් අමාත්‍යාංශ වෙබ් අඩවියේ සඳහන් ප්‍රතිඵල ලේඛනවල අදාළ පිටපත් නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු වලට ඇතුළත් කළ යුතුය.

03. ඉහත කරුණ කෙරෙහි නැවත ඔබගේ අවධානය යොමු කරන අතර, ඒ අනුව උක්ත විභාග ප්‍රතිඵලවලට අදාළව අයදුම්කරුවන් වෙත වෙන් වෙන් වශයෙන් ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීමට කටයුතු කරනු නොලබන බව කාරුණිකව දන්වන අතර, මෙම අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය මගින් (www.pubad.gov.lk වෙත පිවිස මුල් පිටුවේ "Exam Results" දිගුව ඔස්සේ) උක්ත විභාග ප්‍රතිඵල ලේඛන බාගත කර ගත හැකිය.

04. තව ද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්ගේ සේවය ස්ථිර කිරීම් හා උසස්වීම් සඳහා අයදුම්පත් යොමු කිරීමේදී, කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රතිඵල සනාථ කිරීම සඳහා වෙබ් අඩවියේ පළ කරන ලද ප්‍රතිඵල ලේඛනයෙන් බාගත කරන ලද පිටපතක් යොමු කිරීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
දුරකථන : 0112-698605 ෆැක්ස් : 0112-683651
විද්‍යුත් ලිපිනය : pubad.dslas@gmail.com